www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ජනාධිපතිගේ සාම වෙස් මුහුන රූටා යාමට පටන් ගනී

## Sri Lankan president’s "peace" mask starts to slip off

**විජේ ඩයස් විසිනි**

**2007 ජූනි 21**

ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ පසු ගිය මස අග භාගයේ දී මැද පෙරදිගට සිදු කරන ලද සංචාරයක දී අල් ජසීරා රූපවාහිනී සේවයට සම්මුඛ සාකච්ඡාවක් දෙමින් තම ආන්ඩුව එල්ටීටීඊයට එරෙහිව ගෙන යන යුද්ධය ආරක්ෂා කිරීමට යත්න දැරී ය. මෙය, මුග්ධත්වයෙන් උද්ධච්ඡ බවින් හා පරස්පරවිරෝධී බවෙන් කැපීපෙනුනු සාකච්ඡාවක් විය.

ශ්‍රී ලංකාවේ කවර හෝ මාධ්‍යයක - රාජ්‍ය මාධ්‍යයක පවා - මෙම සාකච්ඡාව හෝ එහි අන්තර්ගතය පිලිබඳ සටහන් හෝ පල නොවුනි. මෙම ව්‍යාකූල නිශ්ශබ්දතාව වනාහි රටේ පවතින කුරිරු යුද්ධය සාධාරනීකරනය කරනු වස් දෙසා බෑ බේගල් හෙලිවීමට පටන් ගැනීමෙන් කොලඹ දේශපාලන හා මාධ්‍ය සංස්ථාපිතය මුහුන දෙන අපහසුතාව පිලිබිඹු කරන්නකි. ආරක්ෂක හමුදාවන් විසින් සිදු කරනු ලබන ඝාතන, අතුරුදහන් කිරීම් ඇතුලු ප්‍රජාතන්ත්‍රීය අයිතීන් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් රාජපක්ෂ ආන්ඩුව ජාතිකව හා ජාත්‍යන්තරව වැඩෙන විවේචනයන්ට මුහුන දෙමින් සිටී.

අල් ජසීරා "101 ඊස්ට්" වැඩ සටහන් මෙහෙයවන තයිමූර් නබිල් එදිරිවාදී සම්මුඛ සාකච්ඡාකරුවකු නොවේ. ඔහු සිය සාකච්ඡාව අරඹන ලද්දේ පසුගිය 2005 නොවැම්බරයේ ජනාධිපති රාජපක්ෂ තෝරා ගැනීමෙන් පසු සති කීපයක් වැනි ඉතාමත් කෙටි කලකදී යුද්ධය නැවතත් ආරම්භ කිරීම පිලිබඳව එල්ටීටීඊයට දොස් පවරමිනි. ඔහු රාජපක්ෂගෙන් මුලින්ම අසන ලද පැනය ඒ පිලිබඳව ය. "එල්ටීටීඊය නැවත වරක් සටන් දියත් කිරීමට හේතු සාධක කවරේද?" ජනාධිපති රාජපක්ෂ ඉතා පහසුවෙන් මෙම පැනයට පිලිතුරු දෙමින් "එල්ටීටීඊය හිතන්නට ඇති මම පරාජය කලහැකි දුර්වල මිනිසෙකු කියා. ඔවුන්ට මේක වෙනම රාජ්‍යයක් ස්ථාපිත කිරීමට හොඳ අවස්ථාවක්"

රාජපක්ෂ සාම දූතයකු ලෙස පෙනී සිටින්නට තව දුරටත් යත්න දරමින් සිටිය දී, වැඩි දුර යන්නට මත්තෙන් සිය පරස්පරවිරෝධීතාවය එකින් එකට සනාථවන අයුරින් නබිල්ගේ බංකොලොත් ප්‍රශ්නාවලියට පිලිතුරු දීමට යත්න දැරීය. රජය සහ එල්ටීටීඊය අතර සාකච්ඡා පිලිබඳව ප්‍රශ්න කිරීමේ දී පිලිතුරු දෙමින්, "අපි සාකච්ඡා සඳහා හැමවිටම සූදානම් හැමවිටම, අද උනත් සටන් මැද්දේ උනත් මම සූදානම් සාකච්ඡා කරන්න."

මෙම පිලිතුර මුලුමනින්ම ප්‍රලාපයකි. රාජපක්ෂ විසින් 2002 සටන් විරාමය පිලිබඳ සහ 2002-2003 දී එකඟත්වයට පත්වූ සම්මුතීන් පිලිබඳ සාකච්ඡා කිරීම ඉතා පැහැදිලි ලෙස ප්‍රතික්ෂේප කර තිබිනි. 2006 පෙබරවාරි ජිනීවාහි දී ඔහු සාකච්ඡා සඳහා ඉදිරිපත් වූයේ ඉතාමත් නොකැමැත්තෙන්, අන්තර්ජාතිකව ඔහු ලද පීඩනයට පිටු පෑ නොහැකි වූ බැවිනි. කෙසේවතුදු, රජය විසින් යුද විරාමය පිලිබඳව ඉදිරිපත් කරන ලද මූලික කොන්දේසි සම්බන්ධයෙන් සංශෝධන ඉදිරිපත් කිරීමේ හේතුව මත එම සාකච්ඡා බිඳ වැටිනි. දෙවැනි වතාවටත්, 2006 අප්‍රේල් මස ඔස්ලෝහි පවත්වන්නට යෙදුනු සාම සාකච්ඡා ආරම්භ කිරීමටත් පෙර බිඳ වැටුනේ, කෙටුම්පත පිලිඳ වූ විවිධ මත ගැටුම් හේතු කොට ගෙනයි.

සටන් විරාම ගිවිසුම පිලිබඳව ඇසූ පැනයකට පිලිතුරු දෙමින් රාජපක්ෂ මෙසේ පැවසී ය. "එල්ටීටීඊය ගිවිසුමට ගරු කරන්නේ නෑ. අපි තවමත් එයට ගරු කරනවා. අපි තවමත් ඒ ප්‍රදේශයට අපේ හමුදාව හෝ පොලීසිය යවන්නෙ නැහැ". නමුත් මේ ප්‍රකාශය ද අමූලික බොරුවක් වනුයේ හමුදාවන්ගේ ප්‍රහාරයන් මේ වනවිටත් උතුරු හා නැගෙනහිර එල්ටීටීඊ බල ප්‍රදේශ අල්ලා ගැනීමේ මෙහෙයුම්වල නිරතවන බැවිනි. සම්මුඛ සාකච්ඡාව තවත් තැනක දී ඔහු හමුදාවේ කෙරුම් ගැරන පුරසාරම් දොඩවමින් මෙසේ කියා සිටියේ ය. "අපි නැගෙනහිර පලාත කොටි ත්‍රස්තවාදයෙන් මුදා ගෙන තිබෙනවා. අද ඔවුන් කිලිනොච්චි හා මුලතිව් ප්‍රදේශවලට කොටුවෙලා. අපි ඔවුන් දුර්වල කොට තිබෙනවා."

ඔහුගේ ම මුසාවාදයන් තුල රාජපක්ෂ වැඩි දුරටත් තමාගේ පරස්පරවිරෝධීතාවන් තුලට ම කොටුවෙමින් "ත්‍රස්තවාදීන් දුර්වල කරන තාක් ඔවුන් සාකච්ඡා සඳහා එන්නේ නැති අතර තමන් ශක්තිමත් යැයි සිතන තාක් ඔවුන් රට කැඩීමට උත්සුක වෙනවා" යැයි පැවසී ය.

නබිල්, මෙම ප්‍රශ්නය පැහැදිලි කරනු වස් අතුරු ප්‍රශ්නයක් ඇසී ය. "එසේ නම් ඔබ කියා සිටින්නේ ප්‍රථමයෙන් මිලිටරිමය ජයග්‍රහනයත් දෙවැනිව සාම කතාබහත්?" එයට පිලිතුරු දෙමින් රාජපක්ෂ කියා සිටියේ "නෑ ඒකම නොවේ ප්‍රශ්නය" "මම කිවුවේ, මම අද උනත් පැහැදිලිවම සාකච්ඡාවට කැමතියි." "මගේ අදහස වන්නේ අපි ත්‍රස්තවාදය පිටුදැකිය යුතු බවයි. අපිට බැහැ මෙයට දන නවන්න. මම සූදානම් නැහැ ඔවුන්ගේ අවි බලය ඉදිරියේ දන නවන්න" යනුවෙනි.

මේ අවසථාවේදී නබිල් ඔහුගේ විමතිය පල කරමින් "මට සමාවන්න, මට ඔබේ අදහස තේරුම් ගන්නට අපහසුයි. ඔබ කියන ආකාරයට ත්‍රස්තවාදය පිටුදැකිය යුතුයි. නමුත් ඔබ හිතන්නේ නෑ මිලිටරි ජයග්‍රහනයක් අවශ්‍යයි කියා.?" රාජපක්ෂ පිලිතුරු දෙමින් කියා සිටියේ "ඇත්ත වසයෙන්ම, ත්‍රස්තවාදයට එරෙහිව ජයග්‍රහනය අවශ්‍යයි. ඒක වෙනම කතන්දරයක් නමුත් දෙමල ජනතාවගේ අභිලාෂයන් සැබෑ කරවන්නට නම් මට ත්‍රස්තවාදීන් හා සාකච්ඡා සඳහා යාමට සූදානම්."

නබිල්ට මෙය තේරුම් ගත නොහැකි වූවා විය හැකි ය. නැතහොත්, ඔහු එම ප්‍රහේලිකාව විසඳා ගැනීමට ඔහුට අවශ්‍ය නැතිවා විය හැකි ය. කෙසේවතුදු, මෙම විකාරයන් පිලිබඳ පැහැදිලි කිරීමක් පවතී.

රාජපක්ෂ 2005 "සාමයේ මිනිසකු" යැයි තමා පෙන්වා ගනිද්දීම, ජනාධිපතිවරන උද්ඝෝෂනය තුල 2002 සටන් විරාමය අවසානයට ගෙන ඒමක් හා වහාම යුද්ධයට එලඹීමේ මූලික ඡායාවක් දිස්විය. ඔහු සිංහල අන්තවාදී පක්ෂ වන ජනතා විමුක්ති පෙරමුන හා හෙල උරුමය සමග එල්ටීටීඊයට අවසන් නිවේදන ලබා දෙන ගිවිසුමක් මත සන්ධාන ගතවිය. සටන් විරාම ගිවිසුම නැවත වතාවක් සංශෝධනයට ලක් කරන බවටත්, නෝර්වේ සාම දූතයා ආපසු හරවා යවන බවටත්, එල්ටීටීඊය දෙමල ජනතාවගේ එකම නියෝජිතයා ලෙස තව දුරටත් නොසලකන බවටත්, ඔහු පොරොන්දු වූයේ මින් පෙර සාම කතාබහේ පදනම බලගතු ලෙස විනාශ කරමිනි.

ආක්‍රමනශීලීව ප්‍රතිචාර දක්වනවා වෙනුවට, 2005 මැතිවරනයෙන් සතියකට පසු, එල්ටීටීඊ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් තම වාර්ෂික "වීර දින කතාව" තුල සාකච්ඡා සඳහා හදිසි ආයාචනයක් කලේ මෙසේ යඃ "නව ආන්ඩුව ඉතා ඉක්මනින්ම දෙමල ජනතාවගේ දේශපාලන අභිලාෂයන් තෘප්ත කෙරෙන සාධාරන දේශපාලන රාමුවක් ඉදිරිපත් කල යුතු ය." රාජපක්ෂ එයට ප්‍රතිචාර දැක්වූයේ එල්ටීටීඊය දුර්වල කිරීමේ හා එකට එක කිරීම සඳහා එය අවුස්සා ගැනීමේ අරමුනෙන් හමුදා ප්‍රහාරයන්, මිනීමැරුම් හා ප්‍රකෝපකිරීම් මාලාවක් අන්තර්ගත කැත සැඟවුනු යුද්ධයක් දියත් කිරීමෙනි.

රාජපක්ෂගේ මැතිවරනයෙන් සති 6කට පසු එල්ටීටීඊ හිතකාමී දෙමල ජාතික සන්ධානයේ සාමාජිකයෙකු වන ජෝසප් පරරාජසිංහම් නමැත්තා නත්තල් උදාවේදී පල්ලියේ දේව මෙහෙයට සම්බන්ධවෙමින් සිටිය දී වෙඩි තබා ඝාතනය කරන ලදී. ආන්ඩුව නරුම ලෙස මෙම වගකීම එල්ටීටීඊය මත පටවන්නට තැත් කලද මෙම ඝාතනය රජයේ හමුදාවන් විසින් හෝ ඔවුන් සමග එක්ව ක්‍රියා කරන දෙමල සංවිධානයක් විසින් ක්‍රියා කරන්නට ඇති බවට පැහැදිලි විය. ඉන් සතියකට පසු ත්‍රිකුනාමලයේදී තම විශ්වවිද්‍යාල ප්‍රවේශය ජයග්‍රහනය සමරමින් සිටි සිසුන් පස් දෙනෙකු ද පෙලට සිටුවා වෙඩිතබා ඝාතනය කරන ලද අතර මෙම ඝාතනයන් පොලිස් විශේෂ කාර්ය බලකායෙන් සිදු කරන ලද බවට සියලු සැකයන් පවතී.

මාස ගනනාවක ප්‍රකෝපකිරීම් සහ එල්ටීටීඊයට එකට එක කිරීමෙන් අනතුරුව ජූලි මාසයේ දී එල්ටීටීඊයට එරෙහි ප්‍රහාරය සඳහා රාජපක්ෂ විසින් හමුදාවට අන කෙරින. මෙම ප්‍රහාරයට කඩතුරාවක් ලෙස යොදාගනු ලැබුවේ එල්ටීටීඊය විසින් සිදු කරන ලද "ව්‍යසනකාරී අමානුෂික ක්‍රියාවක්" වූ මාවිල්ආරු වාරිමාර්ග ජලසම්පාදන ගේට්ටුව වසා දැමීමේ සිද්ධිය යි. මෙය රජයේ පොරොන්දුවක් වූ ජල පිරිපහදු සැලැස්ම ආරම්භ කරන ලෙස ආන්ඩුවට පීඩනය යෙදීමේ විරෝධතාවකි. මේ සම්බන්ධයෙන් සාමකාමී විසඳුමකට එලඹීමට රජයට කිසිදු අවශ්‍යතාවක් නොවී ය. අවුල විසඳීම සඳහා සටන් විරාම නිරීක්ෂන කමිටුවෙන් දෙපාර්ශ්වය අතර සාකච්ඡාවක් ඇතිකිරීම සඳහා ගන්නා ලද ප්‍රයත්නයන් ට නැවතීමක් තබමින් මහා පරිමානයේ ප්‍රහාර මාලාවක් දියත් කෙරුනේ 2002 සටන් විරාමය විවෘත ලෙසින්ම කඩකිරීමෙනි.

පුරා 11 මාසයක් මුලුල්ලේ රාජපක්ෂ විසින් තම ප්‍රහාරාත්මක යුද්ධය දියත් කරමින් සිටින අතර මිලිටරිය විසින් දිගින් දිගටම 2002 සටන් විරාම ගිවිසුම කඩ කරමින් එල්ටීටීඊයට නතු ප්‍රදේශ අල්ලා ගන්නා අතර ම සිවිල් වැසියන්ද ත්‍රස්ත කරමින්, ප්‍රමුඛව දෙමල ජනතාව සිය ගනනින් ඝාතනය කරමින් හෝ අතුරුදහන් කරමින් සිටී. මෙම ඝාතන හා අතුරුදහන් කිරීම සිදුවන්නේ රාජ්‍ය අනුග්‍රහය ලත් ඝාතක කල්ලිවල පැවැත්ම විසින් ම පැහැදිලි කල හැකි වාතාවරනයක් තුල ය. රුදුරු ත්‍රස්ත විරෝධී නීතිය යටතේ බොහෝදෙනා සිරකඳවුරුවල රඳවාගෙන ඇත්තේ අවම වශයෙන් නඩු ඇසීම හෝ මහ බලවතුන්ගේ, විශේෂයෙන්ම බුෂ් පරිපාලනයේ සහ එල්ටීටීඊය මත යුද්ධය නැවතත් ඇරඹීමේ අපවාදය පටවමින් සිටින අල් ජසීරාවේ නබිල් වැනි අයගේ සහාය රාජපක්ෂ වෙත ලැබේ.

කාටත් පැහැදිලිව දිස්වන රාජපක්ෂගේ පිලිතුරුවල පවත්නා පරස්පරවිරෝධීතාවන් පැන නගින්නේ පහත සඳහන් කරුනුවලිනි. එක් අතකින් ඔහු එල්ටීටීඊයේ මිලිටරි බලය බිඳ දැමීමේ ආක්‍රමනශීලී ව්‍යායාමයක නිරතවෙමින් කුරිරු ජනවාර්ගික යුද්ධයක් ගෙන යමින් සිටී. ඔහුගේ රජය "සිංහල" රාජ්‍යයක් වසයෙන් පවත්වාගෙන යාම සඳහා කැසකවන මිලිටරියේ ඉහල ධුරාවලියේත්, රාජ්‍ය තන්ත්‍රයේත්, ව්‍යාපාරික ප්‍රජාවේ කොටසකින් නොමඳ අනුග්‍රහය ලබමින් සිටී.

නබිල් කිසිවිටෙක සුපැහැදිලි ප්‍රශ්නය ඇසුවේ නැත: ශ්‍රී ලංකා ජනාධිපති "ත්‍රස්තවාදීන්" සමග කතාකරන්නේ කුමන පදනමක් මත ද? 2003 දී වෙනම රාජ්‍යයක් පිලිබඳ ඔවුන්ගේ දිගුකාලීන ඉල්ලීම ඉවත දැමූ එල්ටීටීඊය සිංහල සහ දෙමල ප්‍රභූන්ට අන්‍යොන්‍ය ලෙස කම්කරු පන්තිය සූරාකෑමට ඉඩ දෙනු ඇත්තා වූ ස්වෛරී උතුර හා නැගෙනහිරක් පිලිබඳ රූපයකින් බලය බෙදා ගැනීමේ සම්මුතියක් ඇති කර ගැනීමට යත්න දැරී ය. මෙම පදනම මත සාකච්ඡා කිරීමේ අභිප්‍රායක් රාජපක්ෂට නැත. 24 අවුරුදු යුද්ධයට සාකච්ඡාමය අන්තයක් ඇති කර ගැනීම සඳහා මෙතුවක් කල් දරන ලද සෑම ප්‍රයත්නයක ම පදනම වූ පලාත්බඳ ආධිපත්‍යය නොතකා හරින ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරනය පිලිබඳ වත්මන් යෝජනා දිස්ත්‍රික් මට්ටමින් සීමිත ලෙස බලය බෙදාහැරීමකට පමනක් ඉඩ දෙයි. රාජපක්ෂ සිතේ තබාගෙන සිටින සාකච්ඡා වනාහී එල්ටීටීඊය යටත්වීමේ කොන්දේසි පිලිබඳව සාකච්ඡා කරන ඒවා බව පැහැදිලි ය.

ආන්ඩුවේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිලිබඳව නබිල් නැගූ ඔතැනි ප්‍රශ්න ශ්‍රී ලංකා ජනාධිපතිවරයා විසින් නොතකා හරිනු ලැබින. " ඇත්තෙන් ම, වාර්තාවන ආකාරයේ මානව හිමිකම් උල්ලංඝනයන් සිදුවන බව පිලිගැනීමට මා සූදානම් නැත" යයි ඔහු කීවේ ය. 700ක පැහැරගැනීම් පිලිබඳ හියුමන් රයිට්ස් වොච්හි වාර්තාවක් පිලිබඳව විමසූ විට රාජපක්ෂ නරුම ලෙසින් කියා සිටියේ අතුරුදහන්ව ඇති සියලු දෙනා වෙනත් රටවලට ගොස් හෝ එල්ටීටීඊයට සම්බන්ධවී ඇති බවයි. "පැහැරගෙන ඇතැයි කියන බොහෝ අය එංගලන්තය, ජර්මනිය ආදී රටවලට ගොස් ඇත"යි ඔහු කීවේය. යුරෝපයේ හෝ වෙනත් කිසිදු තැනකින් පැහැරගැනීමට ලක්වූවන් හදිසියේ සොයා ගනු ලැබී යයි කිසිදු සාක්ෂියක් හෝ උදාහරනයක් ඉදිරිපත් නො කල බව කීම අනවශ්‍යය.

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වාර්තාව පිලිබඳව වැඩෙන විවේචනය ජාත්‍යන්තර මැදිහත් වීමකට හේතු වනු ඇතැයි නබිල් කියූ දෙයට රාජපක්ෂ විශේෂයෙන් සංවේදී විය. "ශ්‍රී ලංකාව එංගලන්තයේ, ඇමරිකාවේ හෝ වෙනත් කිසිදු රටක යටත් විජිතයක් නො වේ. ශ්‍රී ලංකාව ස්වෛරී රාජ්‍යයකි. එම නිසා ඔවුන් මැදිහත් වන විට අප රටේ අභ්‍යන්තර ප්‍රශ්නවලට මැදිහත් නොවී සිටීම වැදගත් ය." යනුවෙන් ජනාධිපතිවරයා උද්ධච්ඡ ලෙස අවධාරනය කලේ ය.

වෙනත් වචනවලින් කිවහොත් තමන්ගේ ක්‍රමවලට විරුද්ධ නොවෙමින් ඇඟිලි නොගසමින්, වර්ගවාදී යුද්ධයට ප්‍රධාන බලයන් පිටුබලය දෙන තාක් කල් රාජපක්ෂ සංතෘප්ත ය. එහෙත් සාමය සඳහා මහා බලාපොරොත්තුවක් ලෙස තබමින් ඔහු ඉන්දියාව සුවිශේෂ කොට දැක්විය. "වර්තමාන තත්වයට අනුව මෙම යුද්ධයට විසඳුමක් ඉදිරිපත් කොට දෙමල ජනයාට උදව් කිරීම සඳහා ඉන්දියාවේ සහාය අවශ්‍යය. අපේ ආන්ඩුව සමග එක්ව ඉන්දියාව වැඩ කල යුතු ය." එල්ටීටීඊය මත වඩවඩා පීඩනය එල්ල කිරීම සඳහා ඉන්දියානු ආන්ඩුව යොදා ගැනීමට රාජපක්ෂ පැහැදිලි ලෙස ම ගනන් බලයි.

සමස්තයක් ලෙස ගත් කල රාජපක්ෂ සමග පැවති සම්මුඛ සාකච්ඡාව අනාවරනය කරන්නේ ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන් විසින් කරනු ලබන දරුනු අපරාධ සඳහා සෘජු වගකීම දරන වාර්ගික යුදකාමියෙකු හෙලිදරව් වෙමින් සාම වෙස් මුහුන ගැලවීයාම ඇරඹී ඇති බවයි.

© www.wsws.org